# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010
### 2012 ජනවාරි / පෙබරවාරි

### සමාජීය විද්‍යා පීඨය

### මානව විද්‍යාව - ANTH - E 2015

### ශ්‍රී ලංකාවේ වැදි ජනතාව

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. වැදි ජනතාව ස්වදේශික ප්‍රභවයක් ඇත්තෝද? මේ පිළිබඳව ඉදිරිපත් වී ඇති අදහස් තාර්කානුකූලව සාකච්ඡා කරන්න.

02. වැද්දන් පිළිබඳ ආර්. එල්. ස්පිටල්ගේ පර්යේෂණයේ ඇති වැදගත්කම ප්‍රමාණ කරන්න.

03. "සාම්ප්‍රදායික වැදි ජනතාව වර්තමානයේ සමාජ ගතිකත්වයට නතුවී තිබේ." උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

04. වැදි ජනතාවගේ සාම්ප්‍රදායික පැවැත්ම කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම් විස්තර කරන්න.

05. වැදි ගෝත්‍රිකයන්ගේ ආහාර සපයා ගැනීම හා සකස්කර ගැනීම පිළිබඳ සාකච්ඡා කරන්න.

06. වැදි නර්තනයන් තුළ අන්තර්ගතවන මිත්‍යා විශ්වාස විමර්ශනය කරන්න.

07. වැදි ගෝත්‍රිකයන් අතර පවත්නා ඥාති සම්බන්ධතාවය විස්තර කරන්න.

08. සාම්ප්‍රදායික වැදි ගෝත්‍රිකයන් ආරක්ෂා කිරීම කොතරම් දුරට ආචාරශීලී වේද? ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

සැලකිය යුතුයි.

පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන ප්‍රමාණවත් තරම් පැවරුමක් ලියන්න. එම පැවරුම පරීක්ෂණය අවසන් කර මාසයක කාලයක් ඇතුලත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

1. ඔබ කැමති වැදි ගම්මානයක් ඇසුරෙන් වර්තමානයේ දී එහි සිදුවී ඇති වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයක්

2. ශ්‍රී ලංකාවේ වැදි ජනතාව පිළිබඳ විදේශිකයන් කළ පර්යේෂණ

**************************